

# පුස්තකාලයට පිය නගමු

21

පුස්තකාලය වූ කලි පොත්පත් සඟරා ඇතුළු තොරතුරු මූලාශ්‍රය තැන්පත් කර ඇති ස්ථානය (පුස්තක+ආලය=පුස්තකාලය) යි. ඉතා දිගු ඉතිහාසයකට උරුමකම් කියන මෙම පුස්තකාල අතීතයේ හඳුන්වා ඇත්තේ පොත්ගුල ලෙස ය. අද වන විට පොත්පත් පමණක් නො ව විද්‍යුත් සඟරා, පරිගණක කෘති ආදි විවිධ වූ නවීන මාදිලියේ තොරතුරු මූලාශ්‍රය තැන්පත් කර ඇති තැනක් බවට පුස්තකාලය පත්ව තිබේ. එහෙයින් කියවීමට පමණක් නො ව ඇසීමට හා නැරඹීමට පවා අද නවීන පුස්තකාල තුළ දී හැකියාව පවතී. විවිධ ප්‍රමාණයේ මෙන් ම, විවිධ අරමුණු සහිත පුස්තකාල ද දැකිය හැකි ය. මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, ආයතනික පුස්තකාල හා පෞද්ගලික පුස්තකාල වශයෙන් විවිධ වර්ගයේ පුස්තකාල අද අපට දැක ගත හැකි අතර ජාතික පුස්තකාල (National Library) පවතින්නේ එක් රටකට එකක් පමණි. ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය කොළඹ 7 නිදහස් මාවතෙහි පිහිටා ඇත.

පුස්තකාලයක පොත් එක් එක් විෂයය අනුව වර්ග කර තැබීමේ ක්‍රමයක් තිබේ. එය ඩිවි දශම වර්ගීකරණය ලෙස හැඳින්වේ. මේ පාඩම පුස්තකාල පරිහරණය පිළිබඳව සාකච්ඡා කෙරෙන්නකි.

විවිධ විෂයයන් යටතේ වර්ග කරන ලද බොහෝ දැනුම් සම්භාරයන් පුස්තකාලයෙහි ගබඩා කර තිබේ. මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසන පරිදි ඇතැම් විට මනුෂ්‍යයෙක් වසර සියයක් ජීවත් වුව ද ලබා ගත නො හැකි දැනුම් සම්භාරයක් සහ අත්දැකීම් ගොන්නක් එක් පොතක් කියවීමෙන් ලද හැකි වෙයි. ලෝකය ජය ගත්තෝ බොහොමයක් කියවීමෙන් දිවිය සරු කර ගත්තෝ වෙති. ශ්‍රේෂ්ඨ සිංහල ගත්කතුවරුන් බොහෝමයක් ම ඊට උදාහරණ ලෙස හුවා දැක්විය හැකි ය. පාසල් පුස්තකාලය ඉගෙනුමට තෝතැන්නක් වෙයි. කුඩා කල කියවීම හුරු වූ විට එය ක්‍රමයෙන් පුරුද්දක්ව ඔබ සමග ම වැඩෙයි.

හත්වැනි ශ්‍රේණිය භාර ගුරුතුමිය පන්තියට පැමිණ හත්වැනි හා අටවැනි කාල පරිච්ඡේද දෙක පුස්තකාලය සඳහා වෙන් කළ බවත් එහි ගොස් කියවීමට සූදානම් වන ලෙසත් සිසුන්ට දැන්වූවා ය. ඔවුන්ගේ රුචි අරුචිකම් අනුව කියවීමට අවස්ථාව සලසා දීම ගුරුතුමියගේ අරමුණ විය. පන්තියේ සිසුන්ගෙන් ඇය ඒ ගැන විමසුවා ය. පන්ති නායක සුධීර පැවසුවේ එක් එක් කතුවරයා ලියූ පොත බැගින් තෝරා ගෙන කියවීම හොඳ බව ය. සිසුහු කතුවරුන් කිහිප දෙනෙකුගේ නම් හඬ නගා කීවෝ ය. "අපි මාර්ටින් වික්‍රමසිංහ, කුමාරතුංග මුනිදාස, එස්. මහින්ද හිමි, ටී. බී. ඉලංගරත්න, ජී. බී. සේනානායක යන කතුවරුන්ගේ පොත් තෝරා ගනිමු" ළමයි සියල්ලෝ ම ප්‍රකාශ කළෝ ය.

පුස්තකාලයට ගොස් අසුන් ගත් සිසුහු **මඩොල්දූව, අපේගම, හීන්සැරය, හත්පණ, මඟුල්කෑම, නිදහසේ මන්ත්‍රය, අඹ යහළුවෝ** සහ **රත් හඳුන් රූපය** යන පොත් තෝරා ගත්හ. කියවීම පටන් ගැනීමට පෙර ගුරුතුමිය සිසුන් ඇමතුවා ය. කියවීම අත්‍යවශ්‍ය බවත් කියවීමෙන් ප්‍රයෝජන රාශියක් ලබා ගත හැකි බවත් ඇය පෙන්වා දුන්නා ය. කියවා ගෙන යන අතරතුර සිත් ගත්, වැදගත් සිද්ධි, ප්‍රධාන චරිත හෝ කතුවරයා ආදි කරුණු සටහන් කර ගැනීම ද ඉතා වැදගත් බවත් ගුරුතුමිය කීවා ය. ශිෂ්‍යයන්ට තමා කැමති පොත් අදාළ රාක්ක වෙත ගොස් තෝරා ගැනීමට ගුරුතුමිය හා පුස්තකාලයාධිපතිතුමිය සහාය වූහ. එක් එක් වර්ග යටතේ පුස්තකාලයේ පොත් අසුරා තබා ඇති ආකාරය එහි දී ශිෂ්‍යයන්ගේ අවධානයට යොමු විය.

එක් එක් පුද්ගලයාගේ දැනුම් මට්ටම් හා කියවීමේ රුචිය විවිධ වන අතර කියවා ලබා ගන්නා වින්දනය ද විවිධ මට්ටම්වල පවතී. සිසුහු එකිනෙකාගේ

රුචිය අනුව පොත් තෝරා ගෙන කියවන්නට පටන් ගත්හ. වැදගත් කරුණු සිය සටහන් පොත්වල ලියා ගැනීමට ද ඔවුහු අමතක නො කළහ. පොත් කියවීමෙන් පසු ඒවා ඊට අදාළ නියමිත ස්ථානයේ තැබීමට ද ගුරුතුමියගෙන් උපදෙස් ලැබිණි. පුස්තකාලයාධිපතිනිය ඒ සඳහා ඔවුන්ට සහාය වූවා ය. නවකතා, කෙටිකතා, පින්තූර කතා, කවි පොත් මෙන් ම විවිධ විෂයයන්ට අදාළ අතිරේක කියවීම් පොත් එක් එක් රාක්කවල වෙන වෙන ම පිළිවෙළට අසුරා තිබීම සිසුන්ගේ අවධානයට නැවතත් යොමු විය. පාසල් කාල පරිච්ඡේද දෙකක් පොත් පත් පරිශීලනය කළ සිසුන්, ඒ කාලය අර්ථවත්ව භාවිත කිරීම ගැන පන්ති භාර ගුරුතුමිය සතුටට පත් වූවා ය. පුස්තකාලය තුළ ගත කළ කාලයෙන් තමන් ලබා ගත් ප්‍රයෝජන සිංහල අභ්‍යාස පොතේ ලියන ලෙස ඇය සිසුන්ට දැන්වූවා ය.

සිසුන් අභ්‍යාස පොත්වල ‘‘පුස්තකාලයෙන් ලබා ගත් ප්‍රයෝජන මොනවා ද?’’ යන ප්‍රශ්නයට පිළිතුරු ලියා තිබිණි. ගුරුතුමිය සිංහල කාල පරිච්ඡේදයේ දී එකිනෙකාගෙන් කරුණු ගෙන සාකච්ඡාව මෙහෙයවූවා ය. ‘‘සුධීර ලබා ගත් ප්‍රයෝජනයක් කියන්න’’ ගුරුතුමිය කීවා ය. ‘‘මම **මඩොල් දූව** නවකතාව කියවා වින්දනයක් ලැබුවා.’’ ඔහු කීවේය. ‘පොතක් නිවැරදිව පරිහරණය කිරීමට හුරුව ලැබුවා’ය යි බුද්ධික කීවේ ය. ‘‘අලුත් දැනුම ලබා ගැනීමටත්, දැනුම ගවේෂණය කිරීමටත්, විමසා බලා තීරණය කිරීමටත් අවබෝධයක් ලැබුවා’’ සුධීර කීවේ ය. ගුරුතුමිය සිසුන්ගේ පිළිතුරු ඇගයීමට ලක් කළා ය. ‘‘අපි විවේකය ප්‍රයෝජනවත්ව ගත කිරීමට පුරුදු වුණා’’ සිසුහු එක හඬින් කීහ. සිසුන් පුස්තකාලය වෙත ගෙන ගොස් පොත් පරිශීලනයට යොමු කිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු වීය යි ගුරුතුමිය සතුටු වූවා ය.

ඊළඟ සතියේ පුස්තකාලයට වෙන් වූ කාල පරිච්ඡේදය ගුරුතුමිය වෙන් කර ගත්තේ පුස්තකාලය පරිහරණය කිරීමෙන් දැනුම ලබා පොත් පත් ලියූ උගතුන් ගැන විස්තර කියා දීමට ය.

‘‘ළමයි අපි අද කතා කරන්නේ කොළඹ මහජන පුස්තකාලයේ ඇති පොත් සියල්ල ම කියවා දැනුම ලබා ගත් උගතකු වන ජී. බී. සේනානායක මහතා ගැන යි. තම පියාගේ අභාවයෙන් පසුව පාසල් ගමන අතර මග නතර වූ පසු ඔහුගේ පාසල බවට පත් වූයේ කොළඹ මහජන පුස්තකාලය යි. ඔහු සිය පෞද්ගලික අත්දැකීම් **විනිවිදිම් අඳුර** නමැති කෘතියේ විස්තර කරනවා. තමාගේ ඇස් දෙක ම අන්ධව සිටිය දීත් විවිධ මාතෘකා ගැන ලබා ඇති දැනුම ඔස්සේ ගලා ආ සිතිවිලි සිය සොහොයුරිය සහ ඇගේ දුව ලවා

ලියවා ඔහු ග්‍රන්ථ 16ක් ම එළිදැක්වූවා. කෙටිකතා පොත් හතරක් කාව්‍ය ග්‍රන්ථ තුනක් චරිතාපදාන තුනක් එතුමා රචනා කළා. 'මගේ විශ්වවිද්‍යාලය මහජන පුස්තකාලය යැයි' ප්‍රකාශ කළ එතුමා එහි තිබූ පොත් විසි පන්දහසක් පමණ මුල් කාලයේ දී ම කියෙව්වා. ජීවිතයේ අවසාන කාලයේ දී දෙනෙත් අන්ධ වුවත් ලිවීම අත්හැරියේ නෑ. එතුමා තුළ තිබූ අප්‍රතිහත ධෛර්යයත් පුස්තකාලය පරිහරණය කිරීමෙන් ලැබූ  දැනුමත් ග්‍රන්ථ නිර්මාණය කිරීමේ කෞශල්‍යයත් නිසා ම, ඔහු සදා අනුස්මරණීය ලේඛකයෙක්. මීට අමතරව මාර්ටින් වික්‍රමසිංහ, සහ කුමාරතුංග මුනිදාස පිළිබඳවත් ඔබගේ අවධානය යොමු කළ යුතු යි'' කියමින් ගුරුතුමිය සිසුන් සමග කළ සාකච්ඡාව අවසන් කළා ය.

''පුස්තකාලයට පිය නගමු''' යන මෙම පාඩම කියවීමෙන් ''කියවීම මිනිසා සම්පූර්ණ කරයි'' යන කියමන සත්‍යයක් බව ඔබට වැටහෙනු ඇත. පාසලේ දී අර්ථවත්ව, ඵලදායි ලෙස කාලය ගත කළ හැකි හොඳ ම තැන පාසල් පුස්තකාලය බව ඔබ සිත තුළ ධාරණය කර ගන්න.

## අවබෝධය

1. පුස්තකාලය පරිහරණය කිරීමේ දී සැලකිය යුතු කරුණු තුනක් ලියන්න.
2. පුස්තකාලය පරිහරණය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න.
3. පුස්තකාලයක පොත් අසුරා තබන පිළිවෙළ සකස් වන්නේ කුමක් පදනම් කර ගෙන ද?
4. ජී. බී. සේනානායකගේ කෘතියක් පාඩමෙන් උපුටා දක්වන්න.
5. ජී. බී. සේනානායක සිය විශ්වවිද්‍යාලය ලෙස හැඳින්වූ ආයතනය කුමක් ද?

## ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ කැමති ලේඛකයකුගේ පොත් නාමාවලියක් සකස් කරන්න.
2. ලේඛක නාමාවලියක් සකස් කර ඔවුන් විසින් ලියා ඇති ග්‍රන්ථ දක්වා පොත් පිංචක් සාදන්න.